පිරිත් බලයෙන් ගුරුකම් හා කෙම් ක්‍රම (පැරණි පුස්කොළ පිටපතක් ඇසුරිනි.)

- වයි. කේ. තිස්ස බණ්ඩාර

"පිරිත්" යන්න අමුතුවෙන් හඳුන්වාදිය යුතු නොවේ යැයි සිතමි. වෙසෙසින් බෞද්ධ ප්‍රජාව පිරිත් කියවනු ලබන්නෙත්, කියනු ලබන්නෙත්, අසනු ලබන්නෙත් අසවනු ලබන්නේත් අචල භක්තියක් මෙන් ම අසීමිත වූ ශ්‍රද්ධාවකින් යුක්තව ය. බෞද්ධ නොවන අයට ද මේ උතුම් ධර්මයෙන් අසීමිත වූ පිහිටක් ලැබිය හැකි බව කිවමනා ය "සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා" යනුවෙන් බොහෝ පිරිත් සූත්‍ර අවසානයේ දී ලියනු ලැබ ඇත්තෙත් කියනු ලැබනුයෙත් සියලු සත්වයෝ සුවපත් වේවා යන්නට යි.

පිරිත් දේශනා ක්‍රම රැසකි. ඒ අතර සති පිරිත් තුන් තිස් පෑ පිරිත්, සර්ව රාත්‍රික පිරිත් වරු පිරිත්, හා සෙත් පිරිත් යනු ඒ ඒ අවස්ථාවන්වල දී කරනු ලබන දේශනා කාල සීමාවන් අනුව යෙදී ඇති ව්‍යවහාර ක්‍රමයයි. විවිධ හේතු කරණ කොටගෙන උක්ත ආකාරයේ පිරිත් සජ්ඣායනා අවස්ථා සිදු කෙරෙනු ඇත. ගිහි - පැවිදි, ස්ත්‍රී - පුරුෂ බාල - මහලු මධ්‍යම ආදී වෙසෙසකින් තොරව පිරිත් කියනු මෙන් ම අසනු ද ලැබේ. ඒ පමණක් නොව උපදින්නට සිටින අයට සෙත් පිණිස ද මිය ගිය අයට පින් පිණිස ද පිරිත් කියනු, අසනු ලැබේ.

පිරිත් සූත්‍ර අන්තර්ගත පොත **"පිරිත් පොත් වහන්සේ"** යනුවෙන් හඳුන්වනු ලැබීමෙන් එහි උදාරත්වය මෙන් ම අගයද තීව්‍ර කරයි. පිරිත් සම්බන්ධයෙන් විවිධ වූ පොත පත ලිපි ලේඛන ලියැවී ඇති මේ සමයේ පිරිත් ධර්මය ආශ්‍රයෙන් බොහෝ පර්යේෂණ ද සිදු කරනු ලැබේ. ම විසින් මෙහි දක්වනු ලබනුයේ වෙනත් ආකාරයක උපයෝගිතාවක් මත ඉතා කෙටියෙන් ලියැවී ඇති **" පිරිත් සන්නය"** නම් පුස්කොළ පොතක් ආශ්‍රයෙන් මෙහි ප්‍රස්තුතයට අදාළ විස්තරයකි.දැනට භාවිතයෙන් තොර පුස්කොළපොතක විස්තර මතු කිරීම මේ ලිපියේ අරමුණ වේ.

ගුරුකම්, යන්ත්‍ර, මන්ත්‍ර ආදිය අප සමාජය කෙරෙන් බැහැර නො වන්නා වූත් බැහැර නො කළ යුතු වූ ත් පුරාණයේ සිට පිළිගනු ලබන කිසියම් විශ්වාස අංගයකි.

මන්ත්‍ර ගුරුකම් පිළිබඳ ව ජනශ්‍රැතියේ එන බොහෝ දෑ කටවහරින් පැවතීමත් රහසිගත ව පවත්වාගෙන යාමත් මත වර්තමානය වනවිට බොහෝ ගුරුකම් ,කෙම් ක්‍රම යන්ත්‍ර මන්ත්‍ර අභාවයට යමින් පවති. එහෙත් ජන විශ්වාසය අභාවයට යෑමක් දක්නට නො මැත. යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් කරනු ලබන අය අන් අයට නො තේරෙන සහ නො ඇසෙන ලෙස කියවනු ලබන බොහෝ දෑ මොනවාදැයි

නො තේරෙයි. එ බඳු යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ශාන්තිකර්ම ආදිය සඳහා පිරිත් සූත්‍ර අනුසාරයෙන් තොරාගනු ලැබ ඇති ගාථා ප්‍රමාණයක් පැරණි පුස්කොළපොතක සඳහන් ය. එයින් උපුටා ගත් කොටසක් පිටපත් කැර**"සාරථී"** මෙ වර කලාපයෙහි පළකරවන්නට සිත් විය. ගුරුකම්, යන්ත්‍ර මන්ත්‍ර අතරේ අත්හදා බැලීම් නො කළ යුතු දෑ ද නැත්තේ නො වේ. ඒ අතරින් එක් නිදසුනක් පමණක් දක්වමු.

"වෙඩි නොවදින මන්තරේ" යනුවෙන් වෙඩි නො වැදීමට යන්ත්‍ර මන්ත්‍ර පැරණි ගුරුකම් පොත්වල ඇත. ඒවා අත්හදා බැලීමට පෙළඹෙන්නේ නම් එය එතරම් බුද්ධිගෝචර ක්‍රියාවක් නො වනු ඇත. ඒ බඳු දේ පුරාණයේ තිබුණා විය හැකි ය. අද තිබෙන වෙඩි තබන යන්ත්‍ර සූත්‍ර මෙල්ල කළ හැකි යන්ත්‍ර මන්ත්‍ර ඇතැයි විශ්වාස කිරීම කීප වරක් කල්පනා කළ යුතු සිතුවිල්ලකි. එහෙත් මෙහි දක්වනු පිරිත් සූත්‍ර ගාථා කියවා එයට දී ඇති උපදෙස් පිළිපැදීමෙන් සෙතක් ශාන්තියක් ලැබෙනු ඇත. "හාත්පසින්ම ආරක්ෂා කරනුයේ යමක් ද එය පිරිත්ය." යනුවෙන් **"පරිසමන්තතෝ තායති රක්ඛතීති පරිත්තං"** ලෙස අටුවාචාරීහු කීහ. බුදු සමයේ පිරිත් පසු සමයේ දී යන්ත්‍ර මන්ත්‍ර සේ ආරක්ෂාව සඳහාත් යම් යම් සහනදායී තත්ත්ව ලැබීම සඳහාත් භාවිත කැර ඇති බවට මෙය එක් නිදසුනිකි.

ඉතා කුඩා පුස්කොළ පත් ඉරු කීපයක් වන **"පිරිත් සන්නය"** නමැති මෙම නිර්මාණය ලියූ අය හෝ කාල වකවානුව සඳහන් නො වුනත් දැනට වසර ආසන්න වශයෙන් සියයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පැරණි විය හැකි බවට සාධක ඇත. අදාළ පුස්කොළ පිටපතෙහි අයිතිකරු හෝ තිබෙන ස්ථානය රහසිගතව තබා ගැනීමට අප බැඳි සිටින අතර එහි පත් ඉරු කීපයක ඡායා පිටපතක් වැඩි විශ්වාසය වෙනුවෙන් මෙහි පළ කරමු. මතු දැක්වෙනුයේ එම පිටපතෙහි අන්තර්ගතයෙන් තෝරාගත් කොටසකි .

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස..!

යානිධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්ලික්ඛේ
සබ්බේ භූතා සුමනා භවන්තු
අතෝපි සක්කච්ච සුනන්තු භාසිතං

තස්මාහි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝච ච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛත අප්පමත්තා

මේ ගාථා දෙක ජප කරන කල පිරිසිදු වස්ත්‍රයක් ඇඳ සඟනට කිරිබත් දන් දී යහපත් පිළිම ගෙයක කිරිබත් පුදා ගිතෙලින් පහන් පුදා ගඳ දුම්මල පුදා මා සිතුවායි සිද්ධවේව යි කියා බුදුන්ට ආරාධනා කොට ලකවැලක් අතට ගෙන අටතුරාසියක් පුරවනු. සියලු කාරියට යහපොති

යං කිඤ්චි චිත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉධම්පි බුද්ධේ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

යන ගාථාවෙහි අභිප්‍රාවනන් යක්ෂයින්ට තෙල් නූල් මතුරනු යක්ෂ මූර්චාවට යක්ෂ උපද්‍රවයට යහපති. බාලයින්ට මතුරනු කොළ මැඩවීමට ගල් හතරක් මතුරා ගාථාව ලියා වාරිය කන්දේ හතරකොන වළලනු අරක්ගලට දපා එසේම කරනු කොලපල්ල නුඟුලුවා මඩවනු යක්කු වි නොගනිත් තවද මෙම ගය බුදුන්ට විළඳ වටා සඟනට කිරිබත් දන් දී අටතුරාසියක් දපනු හැමට වැඩ සිද්ධ වෙයි. ඔයින් , මුහුදින් හෝ වැලිගෙන මෙම ගයින් අටතුරාසියක් පුරවා තමා වසන ගෙයි පිටිහේනේ දමනු යක්කු නො වදිත්, හැම භය දුරුවෙයි. යම් භයක් ඇතිව ගමනක යන කල තුං පුරුක් තියෙන ඊතණ ගහක් කඩාගෙන ඊට අටතුරාසියක් මතුරා හිස පැළඳ මග කිය කියා යනු භය දුරුවෙයි. මෙම ගයින් අබෝවෙයි. මෙම ගය ඔපස් ගත් දා රෑ මතුර පොවනු දරුවෝ සිටිත්, මෙම ගය සපු මලට මතුර වී අටුයේ තබනු වී බෝවෙයි. පිලි පෙට්ටියේ තබනු පිලි වැඩි වෙයි. සත්විටක් කුජ දින සවස ජේ කොට බුද දින උදය අටතුරා සියයක් මතුරා පිලි පෙට්ටියේ තබනු කතුරෝ නොකත්, මෙම ගය සිහිකොට ගොස් අනුන් හා යුක්ති බනනු යහපොති

යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

යන ගාථාව අතට මතුර ඇඟ අතගානු ශ්‍රීයා ඇති වෙයි සියලු භය දුරුවෙයි. සිහි කරනු සතුරෝ මිතුරෝ වෙත් තමා ආශ්‍රය කරෙන් සටනට යනු දිනත් සිහිකරනු සර්ප උපද්‍රව නොවෙයි. සර්පයින් කෑ විට තල් වැටට මතුර ඇඟට සලසු විස හැරෙයි. සත් විටක් මතුර පිස දමනු විස බසියි. අටතුරා සියයක් පිරුව රුජා හැරෙයි. මෙම ගය සශ්‍ය ඵල ආදී සියළු භෝග වලට අටතුරාසියක් දපා වපුරනු, සියළු පනු උපද්‍රා නැතිවෙයි

යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනෝ ගෝතම සාසනම්හි
තේ පත්ති පත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

යන ගාථාව තමා යන කල දෑසල නො කරනු කැමති, සාල් ගැරු තැනින් අකුරු සතක් ගෙන එකකට සත් විටක් මතුර ගෙයි සතර කොන ද ගෙමැද්ද මැද ද ඉස්දොර පාමුල තබනු, තමා කල දෑ ශක නො වෙයි/අනුන් යා යුක්ති බනන කල කාඩි ශැලිය තිබු තැනින් අකුරක් ගෙන සුවඳ පැනින් නාවා මතුර දුමෙහි තබනු දකුණු පය පෙරට තබා යනු දිනත්, කුරුම්ණියන් කෑ පතක් කළුවර දා ජේ කොට තමා ආයුධ ගන්නා කල ඉං පතක් කපා ඊට අටතුරාසියක් මතුරා පුරවා සටනට යනු, යන කල එකක් ඉස තබා යනු එකක් පෙකනියේ තබා යනු පිලිවට එකක් තබා යනු එක පතක් දකුණ තබා යනු ,ශර ඇඟ නො ගනී. මීට ශක නො කරනු මෙම ගය අටතුරාසියක් අතට මතුර දිවුරුමට යනු දිනත් සියලු දේට යහපති

යථින්ද ඛිලෝ පඨවිංසිතෝ සියා
චතුබ්භි වාතේහි අසම්ප කම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරිය සච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝති

යන ගාථාව නො ඉදුල් තෙලට අටතුරාසියක් මතුරා පහන් අවුල්ලා ගෙට ගන්නා ඛිම බලා සිටිය යහපති වට බලා සිටිය නපුරි උඩ බලා සිටිය තුං මංසලින් පාළු වෙයි. මෙම ගය සමන් මලට අටතුරාසියක් මතුර මහ සෑයක හෝ මහ බෝධියක හෝ පිදුව දෙවියෝ අරගනිති. සර්ප බය නොවෙයි. තමා කැමති දේ සිද්ධ වෙයි.රුජා පහරන තැන තෙලට පිරිත් කොට රුජා ඉස්තානේ ගානු. රුජා නැතිවෙයි. පිරිත් කොට පය ඛිම තිබුව සතුරෝ නො වෙත් ෴

යේ අරිය සච්චානි විභාව යන්ති
ගම්භීර පඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

යන ගාථාව අනුන් විසින් භයක් ඇතිනං එක්ව පුරවනු , හතුරු භය දුරුවෙයි. මෙම ගයින් තෙල් හදුං මතුර ඇඟ ගානු, ශ්‍රීයා ඇති වෙයි. සර්ප භය, අග්නි භය, යක්ෂ භය ආදී වු සියලු භය නසන්නේය. මෙම ගයින් තමා උගහයක් ඇතිනං එක්වන් ඇත්නම් ගොරද හෝ සඳුන් හෝ ගෙන අටතුරාසියක් මතුර මෙම ගය සඳහන් කොට මහා සෑයෙහි දි වෙර පසඟුල් දෙත්, අනනු කළ දෙය නොව තමා හට ජය ඇතිවෙයි. යහපති ෴

සහා වස්සන දස්සන සම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කාය දිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි
චතුහපායේහි ච විප්පමුත්තෝ
ජචාභි ඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යන ගාථාව තෙලට අටෝරාසියක් මතුර බුදුන්ට පහන් පුදා සඟනට කිරිබත් දී දන් දී මා සිතූ දේ සිද්ධ වෙවයි කියා තැඹිලි ගහට පිට ලා අටෝරාසියක් මතුර ගසින් මලක් පලඳිනු . ශර ඇඟ නොගනී මෙම ගය කිය කිය සතුරා කරා යනු ශර ඇඟ නො ගනිත් තමට ජය වෙයි. අනුන් තමා එක් වන් කේලාම් කියත් නම් රත් හඳුන් හෝ ගොරද හෝ ගෙන අටතුරාසියක් මතුරා තමා සිතුදේ සිද්ධ වෙවයි සිතා මහා සෑයේ පුදනු මෙම ගය පැනට අටතුරාසියක් මතුර ගෙට හෝ මඬුවට ඉසිනු බලු මැක්කන්නට යහපති
෴

කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන් වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බාතා දිට්ඨ පදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යන ගාථාව පස්වතක් බත් වෙන වෙනම පිඬු කොට එලවරාපත් පිට තබනු හතුරෝ ඇස නො පෙනෙයි. එම පත් දකුණතින් බිජුවට අල්ලා මෙයින් පිරිත් කොට බිජුව පුරනු සතුන් විසින් උපද්‍රව නොවෙයි මෙම ගය කියා කුඹරේ සිසාන කල පිරිත් බනනු ඌරෝ නොකත්, සොරුන් විසින් උපද්‍රව නොවයි. මෙම ගය කියා සඳුනෙන් බෙර ඇස ලියා වපුල වියේ නම කියා කුඹුරෙ නම කියා වපුල ඇසුනු මානේ මැස්සෝ නො කත්, එම දවස් පනිවාදී වූ පවු නො කරනු රතක් ඇඳ පොරවා රතක් ඉසවසා බැඳ රතකිං බෙර වසා මෙම කුඹුර පසක මිනිසුන් නො දක්නා තැනක ලගිනු පොටක ගැටලා කිඹුලො ඇති තැනින් යනු . මෙම ගයින් එකසිය අටවරක් කොට ඒ පිරිත් පැන් නා සබයට යනු යහපති.

වනප්ප ගුම්බේ යථා ඵුස්සිතග්ගේ
ගිම්හාන මාසේ පඨමස්මිං ගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයී
නිබ්බාන ගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

යන ගාථාවෙන් බිජු වපුරනු පැනට දපා ගෙයි ඉසිනු විවාහ ගන්නෝ මෙම ගාථාවෙන් අටතුරාසියක් තෙලට මතුර පාන් දල්වනු පාන් දළුව බිමට තැමුණු සලකුනෙන් ගෙවල් නඟනු මෙයින් පැනට අටෝරාසියක් මතුර ප්‍රසව නො හෙන්නාට පොවනු. ප්‍රසව වෙත්. මෙයින් තෙල් හඳුන් පිරිත් කොට ඇඟ ගානු. ශ්‍රීයා ඇති වෙයි. බුදුන් මාර පරාජය කොට සේ හිතා වැද කොටනු . ආයුධ ගන්නා වේලේ මෙම ගය සිහි කරනු ජය වෙයි මෙගයින් සඳුං මතුර පිලියේ අර්ධ චන්ද්‍රයා ඇඟ වතිං පානු සතුරං ඇකිලේ කුස දරුවන් ඇති ස්ත්‍රීන්ට මෙම ගයින් පිරිත් කොට පැන් නාවනු. දුක් අන්තරා නැති වෙයි අතට මතුර ගෙඩි පිස දමනු. විකායෙයි. සමන් මලට මතුර අසල රජුන් ආදීන් දකිනු යහපති

ශක නො කරනු. උළුවහු පැනීමට වැව් පස් දැමීමට පිංතාලි හැදීමට වඩු කර්මාන්තයට සියලුම දේට යහපති

වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයි
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යන ගාථාවෙන් පැනට මතුරා ගෙයි ඉසිනු පිලි ලැබෙයි. වී කොටන ගේ ලගින ඉපියන්ගෙන් මීයන්ගෙන් උපද්‍රව නැති වෙයි. මතුරා ඉහිනු ගහ කරල යහපත් වෙයි. මෙම ගය කිඹුල්ටනන් යහපති.

ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං /
විරත්ත චිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණ බීජා අවිරුළ්හි ච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපෝ
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යන ගාථාව කියා අඳින පිලියට මතුර උර මාලයටත් මතුර පළඳිනු තල තෙලේ මතුර ඇඟ ගානු සියළු උපද්දා නැතිවෙයි/ අනවින නොවදින මෙම ගසින් පැනට මතුරා ඉසිනු මල්භය දරුවෙයි. කිරිහරකටත් ඉසිනු යහපති. මෙම ගයින් පැං මතුර ඉසිනු සියළු උපද්‍රා නැති වෙයි . හරක් ගාලට ලනු වී කොටනගෙයි ලනු වී බෝ වෙයි

යානිධ භූතානි සමාගතානි /
භුම්මානි වා යානිව අන්ලික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
බුද්ධං නමස්සාමි සුවත්ථි හෝතු

යානිධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්ලික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
ධම්මං නමස්සාමි සුවත්ථි හෝතු

යානිධ භූතානි සමාගතානි
භුම්මානිවා යානිව අන්ලික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
සංඝං නමස්සාමි සුවත්ථි හෝතු

යන ගාථා තුන කියා කුඩා දරුවාට නාවනු මෙම වතුරට මතුර ඉසිනු. ගල් මතුරා වලලනු යක්ෂ ආරක්ෂාවයි. මෙම ගය කියා රජගෙට යනු ප්‍රධානියන් කරා යන විට දකුණු පය ඉදිරි කොට යනු ජය ඇති වෙයි සමන් මලට මතුර ඉසතබා ගොස් ඇමතියන් දකිනු /
රත්න සුත්‍රයයි..

තස්මාහි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථා අපපමත්තා

යන ගාථාව රජුං මහතුං දකින්ඩ තෙල් මතුර ගානු ශ්‍රියාවටය

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානුසාසනං

යන ගාථාව ඇතාට අලියට තුං තුං විට මතුරනු අලියට ගල් වලලනු අද්දුටුවයි. සත්තයි ෴

යථොහං භගිනි ආරියාය
ජාතියා ජාතෝ නාභිජානාමි
සඤ්චිච්ච පාණං ජීවිතං
වොරොපෙතා
තෙන සච්චේන සොත්ථිතෙ හෝතු සොත්ථි
ගබ්භස්සානි

යන ගාථාව වදන්ට බැරි අයට ඕප තෙල් අට වරක් මතුරා දෙනු බිහිවෙයි. සත්තයි ෴

පරිත්තං යං භණන්තස්ස
නිසින්නට්ඨාන ධොවනං
උදකම්පි විනාසෙයි
සබ්බ මෙව පරිස්ස යං
සොත්ථිනාගබ්භ වුට්ඨානං
යඤ්ච සාධෙති තං ඛණෙ
ථෙරස්සංගුලිමාලස්ස
ලොක නාථෙන භාසිතං
කප්පාට්ඨා යි මහාතෙජං
පරිත්තං තං භණාමහෙ

යන ගාථාව තෙලට දපා නාන වඩනු දරු බිහිවෙයි සත්තයි ෴

අභිවාදන සීලිස්ස
නිච්චං වද්ධා පචායිනෝ
චත්තාරෝ ධම්මා වඩ්ඩන්ති
ආයු වණ්ණෝ සුඛං බලං

යන ගාථාව දරු බත් කැවීමට අට වරක් මතුර දෙනු ආයු බල වැඩිවීමටද නීරෝගී වීමටද නුවන වැඩිවීමටද යහපති ෴

සබ්බිතියෝ විවජ්ජන්තු
සබ්බරෝගෝ විනස්සතු
මා තෙ භවත්වන්තරායෝ
සුඛි දීඝායුකෝ භව

යන ගාථාව බාලයන්ට රංකිරි මතුරා දෙනු. ආයු වඩයි. නුවන වඩයි. විජ්ජාව ධාරනයි. යහපති ෴

කරණීය මත්ථ කුසලේන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජු ච සුජු ච
සුවචෝ චස්ස මුදු අනතිමානි

යන ගාථාවෙන් තෙලට අට වරක් මතුරා තිලක ලා යනු රජුං මහතුං දැකීමට යහපති

සන්තුස්සකෝ ච සුභරෝච
අප්පකිච්චෝ ච සල්ලහුක වුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච
අප්ප ගබ්බෝ කුලේසු අනනුගිද්ධෝ

යන ගාථාව අවුරුදු කෝනය දා සමන්මල් තුන් සීයක් ගෙන අට වරක් මතුර වළදනු ආයුස නුවන වැඩීමට යහපති

නච කුද්දං සමාචරේ කිඤ්චි
යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝවා ඛේමිනෝ හොන්තු
සබ්බේ ස්ත්තා භවන්තු සුඛිතත්තා

යන ගාථාව කිඹුලාට මතුරනු යහපති

යේ කේචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තා වා
මජ්ඣිමා රස්ස කාණුකථූලා

යන ගාථාව අලියාට වලහාට මතුරනු සත්තයි
දිට්ඨා වා යේව අද්දිට්ඨා
යේ ච දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසි වා
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

යන ගාථාව අටතුරාසියක් දපා කොල මිරිකනු . අටුවට වී දමනු අළුත් ගෙවල් වලට ගෙ වදිනු

න පරෝ පරං නිකුබ්බේථ
නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

යන ගාථාව නෙරළු තෙලට දපා ගසනු අංගමෙන් මලෝ උපදිත් ,අංගං, සූනියං නො වදී

මාතා යථා නියං පුත්තං
ආයුසා ඒක පුත්ත මනු රක්ඛේ
ඒවං පි සබ්බ භූතේසු
මාන සම්භාවයේ අපරිමාණං

යන ගාථාව ඌර මුවං දකිංඩ තෙල් දපා මුණ දමනු ශ්‍රියාවටයි ෴

සචේමාරිසා දේවනං සංගාම ගතානං උප්පජේය්‍ය භයං වා
ජම්භිත්තං වා ලෝමහන්සෝ වා මමේව ත්සමිං සමයේ
ධජග්ගං උල්ලෝකෙය්‍යාථ, මමං හි වෝ ධජග්ගං
ලෝමහන්සෝ වා සෝ පහීයස්සති.

යන ගාථාව අනවින හදි හූනියන් නො වදී . යහපති ෴

නො චේ මේ ධජග්ගං උල්ලෝකෙය්‍යාථ ,අථ පජාපතිස්ස
දේව රාජස්ස ධජග්ගං උල්ලෝකය්‍යාථ පජාපතිස්ස හි වෝ
දේව රාජස්ස ධජග්ගං උල්ලෝකයතං , යං භවිස්සති භයං වා
ජම්භිතත්තං වා ලෝමහන්සෝ වා සෝ පහීය්සසකි නෝ චේ
පජාපතිස්ස දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ අථ
වරුණස්ස දේව රාජස්ස ධජග්ගං උල්ලෝකයතං , යං
භවිස්සති භයං වා ජම්භිතත්තං වා ලෝමහන්සෝ වා සෝ පහීයිස්සති

යන ගාථාව අනවින හදි හූනියන් නොවදී යහපති ෴

නො චේ පජාපතිස්ස දේව රාජස්ස ධජග්ගං
උලලෝකෙය්‍යාථ , අධ වරුණස්ස දේව රාජස්ස ධජග්ගං
උල්ලෝකයතං , යං භවිස්සති භයං වා ජම්භිත්තාං වා
ලෝමහන්සෝ වා සෝ පහීයිස්සති

යන ගාථාව ඇස්වහ කටවහට තෙල් මතුරනු ෴

නෝ චේ වරුණස්ස දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ
අථ ඊසානස්ස දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ
ඊසානාස්ස හි වෝ දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ
ඊසානස්ස හි දෝ දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ
යං භවිස්සති භයං වා ජම්භිතත්තං වා ලෝමහන්සෝ වා සෝ පහීස්සති.

යන ගාථාව තෙල් හඳුන් දපා තිලක ලනු අනවින හූනියං නොවදී යහපති ෴

නෝ චේ වරුණස්ස දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ
අථ ඊසානස්ස දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ
ඊසානාස්ස හි වෝ දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ
ඊසානස්ස හි දෝ දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ
යං භවිස්සති භයං වා ජම්භිතත්තං වා ලෝමහන්සෝ වා සෝ පහීස්සති.

යන ගාථාව අඳිනා පළඳිනා ආභරණට මතුරනු අනවින යක්ෂ උවදුරු දුරුවෙයි ෴

තං බෝ පන භික්ඛවේ සක්කස් වා දේවා නමින්දස්ස
ධජග්ගං උල්ලෝකයතං පජාපතිස්ස වා දේව රාජස්ස ධජග්ගං
උල්ලෝකයතං වරුණස්ස් දේව රාජස්ස ධජග්ගං
උල්ලෝකයතං වරුණස්ස් දේව රාජස්ස ධජග්ගං
උල්ලෝකයතං ඊසානස්ස වා දේවා රාජස්ස ජම්භිතත්තං වා
ලෝමහන්සෝ වා සෝ පහීයේථාපි නෝ පී පහීයේථ. තං
කිස්ස හේතු?

යන ගාථාව යක්ෂයාට වැසි මුගුරුත්තාවට ඉස අල්ලා සත් විටක් දපනු. යක්කු පස්ස නොබලා දුවත් තෙල් නූල් දපා බඳිනු. යහපති ෴ **පිරිත් සන්නයයි** ෴ ආරෝග්‍යා මස්තු ෴

පොතේ පොදු විස්තරය.

පාරම්පරික පුස්කොළපොතකි. පැරණියි
පත් ඉරු 13 යි.
දිග සෙ.මී. 15 යි
පළල 6 යි

පිරිත් ගාථා බැඳි අකුරින් යුක්තය " ඊ" කාරය "ඉ" ලෙස ඇත. අකුරු කියවීය හැකිය. එක් පත් ඉරුවක් නැත. අකුරු හොඳට ඇත. පිරිත් ගාථා පාලි ක්‍රමයෙන් ලියා ඇත. (පිටපත් කැර පළ කරනු ලබනුයේ ව්‍යවහාර ක්‍රමයටයි.)